# අස්පෘෂ උරුමයක් ලෙස උඩරට කොහොඹායක් කංකාරියේ වැදගත්කම හා එහි ප්‍රවර්ධන ශක්‍යතා පිළිබඳ අධ්‍යයනයක්

**වී.ඩබ්ලිව්.කේ.එච්. බඹරැන්ද[1]**

මුඛ පදඃ අස්පෘෂ උරුමය, උඩරට නර්තනය, කොහොඹායක් කන්කාරිය, ප්‍රවර්ධනය

## හැඳින්වීම

"කොහොඹායක් කංකාරිය" ශ්‍රී ලංකාවේ උඩරට පහතට හා සබරගමු යන ප්‍රධාන නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වය අතුරින් උඩරට නර්තන සම්ප්‍රදායට අයත් ප්‍රධානතම සම්ප්‍රදායික නර්තන අංගය ලෙස හඳුනාගත හැකිය. විජය රජුගෙන් පසු රජ පැමිණි පඬුවස්දෙව් රජ දවස දක්වා ඉතා දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන අස්පෘෂ සංස්කෘතික උරුමයකි. එය මෙරට ජනතාවගේ ඇදහිලි විශ්වාස සිරිත් - විරිත් හා සෞන්දර්යාත්මක චින්තන රටාව එකට මුසු වූ චමත්කාරජනක උත්සවයක් ලෙස පෙන්වාදිය හැකිය. මෙය මෙලෙස ආගමික හා සාමාජීය ඒකාබද්ධතාවය කැටිකොට සිය අධ්‍යාත්මික සුවපත් භාවය තහවුරු කරගනිමින් පරම්පරා ගණනාවක් තිස්සේ පරම්පරාවෙන් පරම්පරාවට පවත්වාගෙන එන ජීවමාන උරුමයක් ලෙස සැළකේ. එනමුත් වර්තමානය වන විට මෙම අස්පර්ශීය සංස්කෘතික උරුමය ඉදිරියට පවත්වාගෙන යෑමේදී විවිධ අභියෝගයන් පැන නැගෙමින් තිබෙන බව නිරීක්ෂණය කළ හැකිවේ. ඒ නව පරපුරේ උනන්දුව අඩුවීම, රට තුළ පවතින ආර්ථික අවස්ථාවරභාවය නිසා පැනනැගී ඇති ඇතැම් දුෂ්කරතාවයන් නිසාවෙන් ද, වර්තමාන සමාජය තුළ සංස්කෘතික අගය පිළිබඳව ඇති අවබෝධය පහළ යෑමත් නිසාවෙන් මෙම අස්පර්ෂීය උරුමය කෙමෙන් කෙමෙන් වියැකෙමින් අවදානමකට ලක් වෙමින් පවතී. මෙම පර්යේෂණයේ ප්‍රධානතම අරමුණ වන්නේ උඩරට කොහොඹායක් කන්කාරියේ අස්පර්ශීය සංස්කෘතික උරුම අගය විග්‍රහ කිරීම, එහි පවත්නා වත්මන් තත්ත්වය සහ අභියෝග හඳුනාගැනීම සහ එය අනාගත පරපුර වෙත ප්‍රවර්ධනය කළ හැකි ක්‍රියාමාර්ග සොයා බැලීමයි.

## ක්‍රමවේදය

මෙම පරීක්ෂණය සඳහා යොදාගනු ලබන පරීක්ෂණ ක්‍රමවේදය වනුයේ ගුණාත්මක පරීක්ෂණ ක්‍රමවේදයයි. එහිදී දත්ත රැස්කිරීම සඳහා සම්මුඛ සාකච්ඡා, සහභාගිත්ව නිරීක්ෂණ සහ ලේඛන විශ්ලේෂණය සිදු කරන ලදී. සම්මුඛ සාකච්ඡා සඳහා ප්‍රධාන ගුරුකුල ද්විත්වයක ජේෂ්ඨතම සාමාජිකයින් දෙදෙනකු තෝරාගත් අතර ඔවුන් ක්ෂේත්‍රීය ප්‍රවීණයන් වන අතරම විශ්වවිද්‍යාල මට්ටමේ ජ්‍යෙෂ්ඨ

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
vishwamithrabambarenda@gmail.com

අධ්‍යයන කාර්යය මණ්ඩල සාමාජිකත්වය ද උසුලනු ලබයි. ඔවුන්ගෙන් ලද තොරතුරු ඔස්සේ මෙම පර්යේෂණය දියත්වේ. සහභාගිත්ව නිරීක්ෂණය මගින් කන්කාරිය සිදුවන අවස්ථා, නර්තනාංග, වාදනාංග, ගායනාංග මෙන්ම නාට්‍යමය අවස්ථා ද, ඇදහිලි - විශ්වාස ඇතුලත් පූජනීයමය අංග ද සටහන් කරගන්නා ලදී. එමෙන්ම ලේඛන විශ්ලේෂණය මගින් සහ සංස්කෘතික දෙපාර්තමේන්තුව වැනි මූලාශ්‍රය අධ්‍යයනය කරමින් ඉතිහාසය හා සාමාජීය පසුබිම පැහැදිලි කරගන්නා ලදී. ලැබුණු විෂයමය දත්ත විශ්ලේෂණය ක්‍රමය මඟින් විග්‍රහ කරමින් ආගමික අර්ථ, සෞන්දර්යමය පැතිකඩ, සමාජීය කාර්යභාරය සහ ප්‍රවර්ධන අභියෝග යන තේමා හතරක් යටතේ හඳුනා ගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

පර්යේෂණයෙන් හෙළිවූයේ උඩරට කොහොඹායක් කන්කාරිය ශ්‍රී ලංකාවේ අස්පර්ශීය සංස්කෘතික උරුමයන් අතර සුවිශේෂී ස්ථානයක් ගන්නා ජීවමාන උරුමයක් බවය. මෙය ආගමික, සෞන්දර්යාත්මක සහ සමාජීය අංග එකට එක්කාසු කරගත් විශේෂාංගයකි. විෂයමය විශ්ලේෂණ මගින් හඳුනාගත් ප්‍රධාන තේමා ලෙස ආගමික හා ආධ්‍යාත්මීය අර්ථයන්, සෞන්දර්යාත්මක හා චාරිත්‍ර-සම්ප්‍රදාත්මක අංගයන් ආදියට එල්ලවිය හැකි බලපෑම් සහ ප්‍රවර්ධන අවශ්‍යතා යන අංග සැළකිල්ලට ගැනුණි.

ආගමික හා ආධ්‍යාත්මීය අර්ථය සම්බන්ධයෙන්, කොහොඹායක් කන්කාරිය බෞද්ධ හා දේශීය ඇඳහිලි, විශ්වාස අතර සන්ධිස්ථානයක් බව අනාවරණය විය. ශිල්පීන්ගේ අදහස් අනුව, එය නොපෙනෙන ලෝකය හා මිනිසුන් අතර සබැඳියාව තහවුරු කරන ආධ්‍යාත්මික ශාන්තිකර්ම චාරිත්‍ර විධියකි. මෙහි සාම්ප්‍රදායික සෞන්දර්යාත්මක අංග සම්බන්ධයෙන්, නර්තන, ගායනය, වාදනය හා නාට්‍යමය අවස්ථා පාරම්පරිකව පැවත එන බවත් උඩරට ජනජීවිතය හා අවියෝජනීය ලෙස බැඳී පවතින බවත් දක්නට ලැබේ. එනමුත් නූතන පරම්පරාවේ ශිල්පීන් මෙම කොහොඹායක් කන්කාරිය ශාන්තිකර්මයෙන් දුරස්ව විවිධ වෙනත් රැකියාවල නියැලීමත්, විවිධ වාණිජ ප්‍රතිලාභ සහිත අවස්ථාවන් වලට සිය නර්තන කුසලතාවය සම්ප්‍රදායික ක්‍රම ශිල්ප වලින් පරිබාහිරව යොදාගන්නා බවත් එමගින් උක්ත උරුමය වියැකීයන්නට නොදී අඛණ්ඩව පවත්වාගෙන යෑම අභියෝගයක් වන බවත් නිරීක්ෂණය විය.

සමාජීය හා සංස්කෘතික බලපෑම මත කන්කාරිය සමාජයේ එකමුතුකම, සංහිඳියාව, සහජීවනය තහවුරුකරන සංකේතයක් ලෙස සැලකේ. නමුත් නූතන සංස්කෘතික විප්ලවය හා ආර්ථික පීඩනය නිසා එය කෙමෙන් වියැකීයෑමේ ප්‍රවණතාවක් පවතින බව දත්ත විග්‍රහයෙන් හෙළිවිය. එම නිසා, පාසල් මට්ටමින් මෙම සාම්ප්‍රදායික නර්තන අධ්‍යාපනය ශක්තිමත් කිරීම, සංචාරක හා ඩිජිටල් ප්‍රවර්ධන වැඩසටහන් දියත්කරලීම, සහ ශිල්පීන්ට සිය උරුමය පවත්වාගෙන යෑමට අවශ්‍ය කලායතන ආරම්භකිරීම ආදී පහසුකම් සලසා දීමත්, ගෝලීය වශයෙන් මෙම උරුමය ප්‍රවර්ධනය හා ප්‍රචාරණය කරලීමට අත්‍යාවශ්‍ය බව මෙම

පරීක්ෂණයෙන් යෝජනා කෙරේ. ඒ අනුව, කන්කාරිය පවත්නා ආකාරය මානව ආධ්‍යාත්මීය සහ සමාජීය අගයන් ප්‍රකට කරන ජීවමාන උරුමයක් ලෙස දැක්විය හැකිය. නමුත් එය අනාගත පරපුරට නව විප්ලවීය සමාජ පසුබිම හා තාක්ෂණ ක්‍රම සමඟ ඊට ඔබින ලෙස නව ආකෘතියකින් යුක්තව ප්‍රවර්ධනය කළ යුතුබව මෙම පර්යේෂණයෙන් යෝජනා කෙරේ.

## සමාලෝචනය

මෙම පරීක්ෂණයේ ශක්‍යතාවය වන්නේ ක්ෂේත්‍රීය පදනමින් දත්ත හා විෂයමය විශ්ලේෂණ එකට එකලස් කරගත් විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ නිගමන වලට එලඹීමට හැකිවීමයි. එහිදී සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණ මගින් ලබාගත් තොරතුරු සවිස්තරාත්මකව විග්‍රහ කරමින් උඩරට කොහොඹායක් කංකාරිය පිළිබඳව නව අර්ථකථනයක් ඉදිරිපත් කිරීමට හැකි විය. නමුත් සීමාවක් ඔස්සේ මෙය ප්‍රචලිතව ඇත්තේ භූගෝලීය ලෙස සීමිත ප්‍රදේශයක වීම හා ශිල්පීන්ගේ සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් අවමවීම නිසා, පරීක්ෂණය ව්‍යාප්තිය රේඛීය ප්‍රදේශයක සිදුකිරීම සහ විවිධ ශිල්පීන්ගේ පරාස ඇතුළත් කිරීම අනාගත අධ්‍යයන සඳහා අවශ්‍ය වේ. මෙම පර්යේෂණය විද්‍යාත්මක හා ප්‍රායෝගික වශයෙන් වැදගත් මඟ පෙන්වීමක් වන අතරම, සංස්කෘතික උරුම සංරක්ෂණයට, සාම්ප්‍රදායික නර්තන අධ්‍යයනය සහ සංචාරක ක්ෂේත්‍රය සඳහා ප්‍රායෝගික යෝජනා ලබාදේ. අනාගත පරීක්ෂකයන්ට, උඩරට කොහොඹා කංකාරිය විවිධ පරම්පරාවන් අතර සංසන්දනාත්මක අධ්‍යයන, ශිල්පීන්ගේ මනෝභාවයන් හා අත්දැකීම් පිළිබඳව විග්‍රහයන් සහ ඩිජිටල් මාධ්‍යය තුළින් ප්‍රවර්ධන ක්‍රම පිළිබඳ අනාගත පර්යේෂණ සිදු කරලීම ඉතා වැදගත් වේ. අවසන් විශ්ලේෂණය අනුව උඩරට කොහොඹායක් කන්කාරිය ශ්‍රී ලංකාවේ සංස්කෘතික අනන්‍යතාවය හා සමාජීයමය වටිනාකම එකට එක්කාසු කොට ගොඩනැගීමේ අතිශය සංකීර්ණ පද්ධතියකි; එබැවින්  එය රැකගැනීම හා ප්‍රවර්ධනය කරලීම ජාතික වගකීමක් ලෙස සැළකිය යුතුය.

## ආශ්‍රිත මූලාශ්‍රය


දිසානායක, මුදියන්සේ. (1988). ***කොහොඹා යක් කංකාරි සහ සමාජය.*** ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, මුදියන්සේ. (1998). ***කොහොඹා යක් කංකාරි කාව්‍ය සාහිත්‍ය.*** ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.